**ලංසු සඳහා ආරාධනය (Invitation for Bids)**
**(ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති)**

**අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව**

**අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැඩිල්ල-අක්කර 05 මාර්ගය (පන්සල පාර) සංවර්ධනය කිරීම**

(කොන්ත්‍රාත් අංක: …………)

1. අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අයත් මැඩිල්ල-අක්කර 05 මාර්ගය (පන්සල පාර) සංවර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **සුදුසුකම්ලත්** හා අසාධුලේඛනගත නොවූ CIDA ආයතනයේ ලියාපදිංචි, ඒ සඳහා උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු ආරාධනා කරනු ලැබේ.

2. මෙම කොන්ත්‍රාත් සඳහා ඇස්තමේන්තුගත මූලික පිරිවැය රු 7,950,000.00 වේ. කොන්ත්‍රාත් කාලසීමාව දින 90 ක් වේ.

3. මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු ක්‍රමවේදය (National Competitive Bidding - NCB) අනුව සිදු කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධුලේඛණ ගත නොතිබිය යුතු අතර, CIDA ආයතනයේ ලියාපදිංචි කරන ලද C-07 හෝ ඊට ඉහළ ශ්‍රේණිගත කරන ලද මාර්ග ඉදිකිරීම සඳහා ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026/06/15 දින සිට 2026/07/02 දින දක්වා සෑම වැඩකරන දිනයකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත අදාල ආපසු නොගෙවන රු 4,000.00 ක ලංසු ලියවිලි ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

6. ලංසු ලියවිලි වල ඉල්ලා ඇති තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛන වල සහතික කළ පිටපත් ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

7. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) 2026/06/25 වන දින පෙ.ව. 10.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ.

8. නිසි පරිදි සම්පූර්ණ කරන ද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම්කර මුද්‍රා තබා එක කවරයකට බහා 2026/07/03 වෙනි දින ප.ව.2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ අකුරණ ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, අකුරණ

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අකුරණ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියකට බහාලීම කළ හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහළ වම් කෙළවර අදාල ලංසුවේ නම (අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අයත් මැඩිල්ල-අක්කර 05 මාර්ගය (පන්සල පාර) සංවර්ධනය කිරීම) හා ලංසු අවසන් දිනය (2026.07. 03) සඳහන් කළ යුතුය.

9. ලංසුපත් 2026.07.03 වෙනි දින ප.ව.02.00 ට විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයන්ට ඒ සඳහා සහභාගි විය හැකිය.ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසු විවෘත කිරීමේ දිනයේ සිට දින 77 ක කාලයක් ලංසු වලංගු විය යුතුය.

11. ලංසුව රු. 100,000.00 ක ලංසු සුරක්ෂණය (Bid Security) සමඟ ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය 2026.06.15 දින සිට 2026.09.27 දින දක්වා (දින 105ක්) වලංගු විය යුතුය.

12. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබා ගත් ලංසු විවෘත කළ දින සිට දින 105 ක් වලංගු වන පරිදි මෙම ආරාධනා ලිපියේ 11 වෙනි ඡේදයේ සඳහන් වටිනාකමින් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන ලද තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණ අකුරණ ප්‍රාදේශීය **ලේකම්** නමින් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

13. ලංසුකරුවන් විසින් අදාළ ස්ථානය නිරීක්ෂණය කර වැඩ පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකිය.

14. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

මේ සඳහා වැඩි විස්තර දුරකථන අංක 081-2304895 මගින් ගණකාධිකාරී වෙතින් ලබා ගත හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අකුරණ.